# විධායක සාරාංශය

- වර්ෂ 2015 සිට රජයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අදහස් විමසීමේ දී, රජයේ ක්‍රියාකාරීත්වය අතිශයින්ම හොඳ තත්වයක තිබෙන බවත් තවදුරටත් කිසිදු දියුණුවක් අවශය නොවන බවත් ප්‍රකාශ කරන ලද්දේ 1.1%ක් වූ ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණයක් පමණි. රජයේ ක්‍රියාකාරීත්වය හොඳ මුත් රජය විසින් තවදුරටත් ප්‍රතිඵල පෙන්විය යුතු බව 42.3% ක් ප්‍රකාශ කරන ලදි. රජයේ ක්‍රියාකාරීත්වය නරක බවට ප්‍රකාශ කල 23% ක් වූ ශ්‍රී ලාකිකයින්ගේ අදහස වූයේ නිසි ප්‍රතිඵල පෙන්වීම සඳහා රජයට තවදුරටත් කාලය ලබාදියුතු බවය. රජයේ ක්‍රියාකාරීත්වය නරක බවටත් එය හැකි ඉක්මනින් ඡන්දයකින් වෙනස් කලයුතු බවත් 16.5%කගේ අදහස විය.

- උතුරු හා නැගෙනහිර පළාත් නියෝජනය කල 75% ක් පමණ වර්ෂ 2015 සිට රජයේ ක්‍රියාකාරීත්වය හොඳ තත්වයක තිබෙන බවට ප්‍රකාශ කරන අතරම ඒ පිළිබඳව වඩාත්ම අසතුටුදායක තත්වයක් පෙන්නුම් කරන ලද්දේ දකුණ, උතුරු මැද, ඌව සහ සබරගමුව යන පළාත්හි වෙසෙන ජනතාවය. වර්ෂ 2015 සිට රජයේ ක්‍රියාකාරීත්වය නරක බවටත් එය හැකි ඉක්මනින් ඡන්දයකින් වෙනස් කලයුතු බවත් දකුණු සහ උතුරු මැද පළාත්හි 30%ක පමණ ජනතාවක් ප්‍රකාශ කරන ලදි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු දැනුම් දීමේදී රජය කොතරම් සාර්ථකද යන්න පිළිබඳව අදහස් විමසීමේ දී, 55% ක් වූ ශ්‍රී ලාකිකයින් ප්‍රමාණයක් ඒ පිළිබඳව රජය අසාර්ථක බව ප්‍රකාශ කල අතර ඒ තුළ 30% ක්ම එහිදී රජය ඉතා අසාර්ථක බව පෙන්වා දී තිබුණි.

- ව්‍යවස්ථාදායක සභාව සහ එහි අනු කමිටු තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව කෙරෙන සාකච්ඡාවන්හි අන්තර්ගතය ප්‍රසිද්ධ කිරීම සම්බන්ධයෙන් රජය අසාර්ථක (එය ඉතී අසාර්ථක බව ප්‍රකාශ කරන 30.8% ක් වූ ශ්‍රී ලාකිකයින් ප්‍රමාණයක් ද ඇතුළුව) බව 55% ක් වූ ශ්‍රී ලාකිකයින් ප්‍රමාණයක් ප්‍රකාශ කරන ලදි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇතුලත් කලයුතු හෝ වෙනස් කලයුතු වන්නේ කවර කාරණාවන්ද යන්න දැනගැනීම පිණිස පුරවැසියන්ගෙන් අදහස් විමසීම සම්බන්ධයෙන් ද රජය අසාර්ථක බව 56.4% ක් වූ ශ්‍රී ලාකිකයින් ප්‍රමාණයක් ප්‍රකාශ කරන ලදි.

- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් වර්ෂ 2016 ඔක්තෝබර් මස පැවැත්වූ අධ්‍යයනය සමග සැසඳීමේදී සමස්ථයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත්භාවයෙහි තරමක වැඩිවීමක් පෙන්නුම් කරන ලදි. වර්ෂ 2016 ඔක්තෝබර් හිදී 22% ක් වූ එකී දැනුවත්භාවය වර්ෂ 2017 මාර්තු මස 29% ක් බවට දැකිවුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කල ප්‍රතිශතය මෙකී කාල පරාසය තුළ 24% සිට 12% දක්වා පහත වැටී තිබේ.

- දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම වෙනස් කල යුතුද හෝ ඊට අවශ්‍ය සංශෝධන හඳුන්වාදී එයම පවත්වාගෙන යායුතුද යන කාරණය විමසීමේදී, 23.5% ක්වූ ශ්‍රී ලාකිකයින්ගේ අදහස වූයේ අපට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය වන බවත් 38.9% ක්වූ ප්‍රමාණයකගේ මතය වූයේ අවශ්‍ය සංශෝධන හඳුන්වාදී පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම පවත්වාගෙන යායුතු බවත්ය.

- විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කලයුතුය යන මතයට ශ්‍රී ලාකිකයින් අතර තිබූ සහයෝගය තරමක් පහතවැටී ඇති බව පෙන්නුම් කරයි. වර්ෂ 2016 ඔක්තෝබර් හිදී 35.7% ක් වූ එකී සහයෝගයෙහි ප්‍රතිශතය වර්ෂ 2017 මාර්තු මස 30.1% ක් දක්වා පහතවැටී තිබුණි. එම සහයෝගහෙි පහත වැටීම බස්නාහිර පළාත තුළ (36.7% සිට 35.7% දක්වා ද), උතුරු මැද පළාත තුළ (48.6% සිට 30.8% දක්වා ද), ඌව පළාත තුළ (32.8% සිට 21.1% දක්වා ද) සහ සබරගමුව පළාත තුළ (44% සිට 29.5% දක්වා ද) ආදී වශයෙන් වර්තා වුණි. විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කලයුතුය යන මතයට සහයෝගය නොදෙන පිරිසෙහි වැඩිවීමක් පෙන්නුම් කෙරෙන අතර එය මධ්‍යම පළාත තුළ (27.4% සිට 40.8% දක්වා ද), ඌව පළාත තුළ (32.8% සිට 59.6% දක්වා ද) සහ සබරගමුව පළාත තුළ (40.8% සිට 50.2% දක්වා ද) ආදී වශයෙන් වර්තා වුණි.

- මෙම අධ්‍යනය තුළදී, ජනමත විචාරණයක් යනු කුමක්දැයි දන්නේද යන්න විමසූ කල්හි, ශ්‍රී ලාංකිකයින්ගෙන් 62.1% ක් ඒ පිළිබඳව දන්නා බවත් 37.3% ක් ඒ පිළිබඳව නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි. ජනමත විචාරණයක් යනු කුමක්දැයි දන්නා බව ප්‍රකාශ කල පිරිස අතර සබරගමුව පළාත තුළ 88% ද, වයඹ පළාත තුළ 82% ද, සහ උතුරු මැද පළාත තුළ 70% ක්ද විය. ජනමත විචාරණයක් යනු කුමක්දැයි නොදන්නා බව ප්‍රකාශ කල පිරිස අතර නැගෙනහිර පළාත තුළ 54.6% ක්ද සහ උතුරු මෙන්ම දකුණු පළාත් තුළින් 50% ක පමණ ප්‍රමාණයක්ද වාර්තා වුණි.

- අර්ථවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් උදෙසා ජනමත විචාරණයක් අවශ්‍ය දැයි ජනමත විචාරණයක් යනු කුමක්දැයි දන්නා බව ප්‍රකාශ කල පිරිසෙන් විමසූ කල්හි ඔවුන්ගෙන් 85.6% ක් ප්‍රකාශ කරන ලද්දේ එවැන්නක් අවශ්‍ය වන බවයි. ජනමත විචාරණයකින් තොරව ශ්‍රී ලාංකාවට අර්ථවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් ළඟාකරගතහැකි බවට දකුණු පළාතෙන් 21.4% ක් ද සහ නැගෙනහිර පළාත තුළින් 17.7% ක් ද ප්‍රකාශ කරන ලදි.

- රජය විසින් ප්‍රමුඛතාවය දියයුතු බවට ලාංකිකයින් විශ්වාස කරනු ලබන මූලික කාරණා ත්‍රිත්වය වන්නේ (1) ආර්ථිකය සහ සංවර්ධනය (2) නීතිය හා සාමය (3) දූෂණය ආදියයි. මෙකී තෝරාගැනීම සිදු කරන ලද කාරණා ලැයිස්තුවෙහි තිබූ අනෙකුත් කරුණු ද්විත්වය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සමඟි සංධානයයි. ඔවුන්ගේ පළමු තේරීම කුමක්ද

යනත් විමසූ කල්හි, රජය විසින් ඒ සඳහා (ආර්ථිකය සහ සංවර්ධනයට) ප්‍රමුඛත්වය දිය යුත්තේ ජීවන වියදම පහත දැමිය යුතු නිසාවෙන් බව දැක්වුණි.

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව ක්‍රියාවලියක් සහ සංක්‍රාන්තීය යුක්තිය පිළිබඳ ක්‍රියාවලියක් එකවර සිදුවිය යුතුද එසේ නැතිනම් එක් ක්‍රියාවලියකට පසු අනෙක් ක්‍රියාවලිය සිදුවිය යුතුද යන්න විමසූ කල්හි, ඒ පිළිබඳව තමන් නොදන්නා බව ලාංකිකයින්ගෙන් 46.5% ක් ප්‍රකාශ කරන ලද අතර 20% ක් ප්‍රකාශ කරන ලද්දේ මෙම ක්‍රියාවලින් ද්විත්වයම එකවර සිදුවිය යුතු බවය. මෙම ක්‍රියාවලින් ද්විත්වයම එකවර සිදුවිය යුතු බවට උතුරු පළාතේ 40.4% ක් ප්‍රකාශ කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සංක්‍රාන්තීය යුක්තිය පිළිබඳව කාරණාවන්ට වඩා රජය විසින් සිය අවධානය වැඩි වශයෙන් යොමු කලයුතු වැදගත් ප්‍රශ්ණ තිබෙන බවට ලාංකිකයින්ගෙන් 66.2% ක් විශ්වාස කරයි. උතුරු සහ නැගෙනහිර පළාත් හැර අනෙක් සියලුම පළාත් වල මෙම අදහස පවතී. එලෙස  අවධානය වැඩි වශයෙන් යොමු කලයුතුව පවතින වෙනත් ප්‍රශ්ණ මොනාදැයි විමසූ කල්හි, ලබාදුන් පිළිතුරු සියල්ලම පාහේ ආර්ථිකය සහ සංවර්ධනය - එනම්, ජීවන වියදම, යටිතල පහසුකම් සංවර්ධනය, රටේ සංවර්ධනය සහ විරැකායාව ආදී තත්වයන්ට සම්බන්ධ ඒවා විය.

Centre for Policy Alternatives
Opinion Poll on Constitutional Reform – March 2017

Full report – [http://www.cpalanka.org/wp-content/uploads/2017/04/Rapid-survey_final-report_March-2017.pdf](http://www.cpalanka.org/wp-content/uploads/2017/04/Rapid-survey_final-report_March-2017.pdf)